පොලිස් සංඛ්‍යාලේඛනයන්ට අනුව, 2020 වසර තුළ ශ්‍රී ලංකාව තුළ වාර්තා වූ දිවි තොර කරගැනීම් ප්‍රමාණය 3,074 කි. එය සාමාන්‍යයක් ලෙසින් ගත් විට දිනකට දිවි අහිමි කරගැනීම් 8.4 කි.
දිවි තොර කරගැනීමේ සිදුවීම් වාර්තා කිරීමේදී ඒ සම්බන්ධයෙන් හඳුන්වා දී ඇති ආචාර ධර්මයන්ට අනුකූල වන ලෙසින් මාධ්‍ය දිරිමත් කෙරෙන්නේ, ප්‍රධාන කොටම ප්‍රවේසම් රහිතව දිවි අහිමි කරගැනීම් වාර්තා කිරීම මගින් තවත් දිවි තොර කරගැනීම් පැතිර යෑම සඳහා දායකත්වයක් ලැබිය හැකි බැවිනි.
උදාහරණ ලෙසින් දක්වන්නේ නම්, දිවි තොරකරගත් ආකාරය පළ කිරීම නොකළ යුත්තේ තවෙකෙකු එය අනුකරණය කිරීමට හැකියාවක් තිබේ. දිවි තොර කරගත් ආකාරය දීර්ඝව විස්තර කිරීමද ගැටළුකාරී වන්නේ ඒ අර්ථයෙන්ම වේ.
එසේම දිවි තොර කරගැනීම් පිළිබඳ පුවත් වාර්තාවක් හා හදිසි උපකාරක අංක පළ කිරීම ඔස්සේ, දිවි තොර කරගැනීමේ නැඹුරුතාවක් ඇති තවත් අයෙකුගේ දිවි බේරා ගැනීමට ඉන් ඉඩක් ලැබෙනු ඇත.
මූලාශ්‍ර:
https://www.police.lk/index.php/item/138
https://apps.who.int/.../WHO-MSD-MER-17.5-eng.pdf...
https://accountablejournalism.org/.../australia-standards...
හදිසි උපකාරක අංක:
*1333-CCCline
* ශ්‍රී ලංකා සුමිත්‍රයෝ -0112696666
*ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926
#MediaEthicsSL #lka #SinhalaNews #Mawbima #Aruna